සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

39149

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

### 11 ශ්‍රේණිය

### බුද්ධ ධර්මය - I

නම/විභාග අංකය :- ............................................................................ කාලය : පැය 01 යි.

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
❖ මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රය එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ "×" ලකුණ යොදන්න.

(1) බෝසතාණන් වහන්සේ තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලූහ. එය හඳුන්වන්නේ,
1. පංච මහා විලෝකන නමිනි. 2. පංච මහා බලවේග නමිනි.
3. පංච අභිඥා නමිනි 4. පංච සතිකා නමිනි

(2) මාගන්දියා, චිංචි මානවිකාව යන අයගේ උපහාස අපහාස ඉවසූ බුදුරජාණන් වහන්සේ, කෝසල, බිම්බිසාර වැනි මහ රජවරු උන්වහන්සේගේ සේවය අගය කළ අවස්ථාවේ ද උද්දාමයට පත් නොවූහ. ඉන් ප්‍රකට වන්නේ උන්වහන්සේ තුළ පැවති,
1. යථාවාදී තථාකාරී ගුණයයි 2. තාදී ගුණයයි
3. නිරහංකාර ගුණයයි. 4. සමානාත්මතාවයයි

(3) චූල්ල කම්ම විභංග සූත්‍රයට අනුව ද්වේශයෙන් තොරව කටයුතු කරන්නා,
1. රූමත්ව උපදී 2. උසස්යයි සම්මත කුලවල උපදී
3. ප්‍රඥාවන්තව උපදී 4. නිරෝගීව උපදී

(4) සියලු කෙලෙස් දුරු කළ හෙයින් ද, රහසින්වත් පව් නොකළ හෙයින්ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ හෙයින්ද, බුදුරජාණන් වහන්සේ,
1. සම්මා සම්බුද්ධ නම් වේ. 2. සුගතෝ නම් වේ.
3. අරහං නම් වේ. 4. ලෝක විදූ නම් වේ.

(5) බුදුරජාණන් වහන්සේ චින්තන විමංසන නිදහස අගය කළ බව දැක්වෙන සූත්‍රයක් වන්නේ,
1. කාලාම සූත්‍රය 2. පත්තකම්ම සූත්‍රය 3. සෝණදණ්ඩ සූත්‍රය 4. මංගල සූත්‍රය

(6) පිප්පලී ගුහාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ සත්ත බොජ්ඣංගය දේශනා කිරීමෙන් අනතුරුව රෝගය සුවපත් වූයේ,
1. මුගලන් මහරහතන් වහන්සේගේ 2. සැරියුත් මහරහතන් වහන්සේගේ
3. අනුරුද්ධ මහරහතන් වහන්සේගේ 4. මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ

(7) ''දානං සීලංච නෙක්ඛම්මං.....'' ගාථාවෙන් දැක්වෙන්නේ,
1. දසරාජ ධර්මය 2. දස සක්විතිවත්ය 3. දස පාරමිතාය 4. දස පුණ්‍ය ක්‍රියාය.

(8) බෝසතාණන් වහන්සේ අධිෂ්ඨාන පාරමිතාව සම්පූර්ණ කළ බව දැක්වෙන ජාතක කතාව වන්නේ,
1. මඛාදේව ජාතකයයි 2. මඝ මානවක ජාතකයයි.
3. තේමිය ජාතකයයි 4. මහාකපි ජාතකයයි

(9) දරුණු නාලාගිරි ඇතා බුදුරජාණන් වහන්සේගේ සිරිපා අබියස දණ නැමුවේ උන්වහන්සේ තුළ පැවති,
1. කරුණා ගුණය නිසා ය. 2. තාදි ගුණය නිසා ය
3. මෛත්‍රී ගුණය නිසා ය. 4. අවිහිංසාවාදී ගුණය නිසා ය.

(10) නිවන් පසක් කිරීමට අවශ්‍ය වන මනා වූ පිළිවෙත් රකින බැවින් සංඝරත්නය,
1. සුපටිපන්න නම් වේ. 2. උජුපටිපන්න නම් වේ. 3. සාමීචි පටිපන්න නම් වේ. 4. දක්ඛිණෙය්‍යය නම් වේ.

(11) සුරේඛා අසල්වැසි නිවසේ අය සැපසේ ජීවත් වනු දැක ඔවුන්ට ඊර්ෂ්‍යා නොකොට සතුටු වේ. සුරේඛා තුළ ඇති ගුණාංගය වනුයේ,
1. මෙත්තා ය. 2. කරුණාව ය. 3. මුදිතාව ය. 4. උපේක්ඛාය.

(12) පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු,
1. සතර කර්ම ක්ලේශ යි. 2. සතර ඍද්ධිපාදය
3. සතර අගතිය යි. 4. සතර මහා භූත රූපය

(13) A පැළලුප් නුවර අශෝකාරාමය
B විශාලා මහනුවර වාලුකාරාමය
C සප්තපර්ණී ගුහා ද්වාරය අභියස
D මාතලේ අලු විහාරයේ දී
ධර්ම සංගායනා පැවැත් වූ ස්ථාන පිළිවෙළට පෙළගැස්වූ විට,
1. ABCD නිවැරදි වේ. 2. CABD නිවැරදි වේ. 3. CBAD නිවැරදි වේ. 4. ACBD නිවැරදි වේ.

(14) සිඟාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන් දක්වා ඇති දිශාව වන්නේ,
1. නැගෙනහිර දිශාව 2. දකුණු දිශාව 3. උතුරු දිශාව 4. උඩ දිශාව

(15) අනුලෝම පටිච්ච සමුප්පාදයෙන් සසර දුක් ඇතිවන ආකාරය දැක්වේ. එහිදී සිතින් දැඩිව අල්ලා ගැනීම නිසා නැවත භවයට එකතු වේ. යන්න දැක්වෙන්නේ,
1. උපාදාන පච්චයා භවෝ යනුවෙනි 2. වේදනා පච්චයා තණ්හා යනුවෙනි.
3. ඵස්ස පච්චයා වේදනා යනුවෙනි. 4. සංඛාර පච්චයා විඤ්ඤාණ යනුවෙනි.

(16) දෙවන ආත්ම භවයෙන් පසුව කවර හෝ ආත්ම භවයක විපාක දෙන කර්ම හඳුන්වන්නේ,
1. අපරාපරිය වේදනීය කර්ම යනුවෙනි. 2. උපපජ්ජ වේදනීය කර්ම නම්නි.
3. ගරුක කර්ම නම්නි. 4. කටත්තා කර්ම නම්නි.

(17) කොසොල් රජුගේ බිසවක වූ මල්ලිකාව අවසන් මොහොතෙහි සිතට නැගුණු අකුසල සිතුවිල්ලක් හේතුවෙන් දුගතිගාමී විය. එයට හේතුව වූයේ,
1. ආචිණ්ණ කර්මය 2. ආසන්න කර්මය
3. දිට්ඨධම්ම වේදනීය කර්මය 4. අපරාපරිය වේදනීය කර්මය

(18) දිවා රෑ දෙකෙහිම භාවනාවට යොමුකළ සිත් ඇති බුදු සව්වෝ නිරතුරු ප්‍රබුද්ධ ජීවිතයක් ගත කරති'යි බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එහිදී ප්‍රබුද්ධ ජීවිතය යනුවෙන් දැක්වෙන්නේ,
1. අලසකමින්, උදාසීනකමින් හා අසහනයෙන් තොර ජීවිතයයි.
2. බුද්ධ ශ්‍රාවකයෙකු වශයෙන් ගත කරන ජීවිතයයි.
3. සියලු කෙලෙස් යටපත් කරමින් ගත කරන ජීවිතයයි.
4. දිවා රෑ පිංකම් වල නිරත වෙමින් ගතකරන ජීවිතයයි.

(19) දුර ගමන් කරන, තනිව හැසිරෙන, ශරීරයක් නැති, ගුහාවක වෙසෙන සිත දමනය කරගන්නා තැනැත්තා මාරයාගේ බැම්මෙන් මිදේ, යන අදහස දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
1. සුකරානි අසාධූනි.... 2. දානංච ධම්මචරියාච....
3. කායේන සංවරෝ සාධු..... 4. දූරංගමං ඒක චරං.....

(20) තණ්හාව මුල්කොට සමාජයේ කලකෝලාහල ඇතිවෙන අයුරු පටිච්ච සමුප්පාදයට අනුව පෙන්වා දී ඇත්තේ,
1. මහානිදාන සූත්‍රයේ 2. චක්කවත්ති සීහනාද සූත්‍රයේ
3. අග්ගිවච්ච ගොත්ත සූත්‍රයේ 4. පත්තකම්ම සූත්‍රයේ

(21) බුදු දහමේ පංච නීවරණ උපමා මගින් දක්වා තිබේ. එහිදී පාසි සහිත ජලයට උපමා කර ඇත්තේ,

1. ථීන මිද්ධ ය. 2. විචිකිච්ඡාව ය. 3. ව්‍යාපාදය 4. උද්ධච්ච කුක්කුච්චය

(22) පහත සඳහන් කරුණු අතරින් විදර්ශනා භාවනාවේ ආනිසංස වන්නේ කුමන ආනිසංසයන්ද?

A. අටලෝ දහමට මැදහත් ව මුහුණ දීමේ හැකියාව
B. කායික මානසික දුක් පීඩා විඳ දරා ගැනීමට හැකියාව ලැබීම.
C. පංච නීවරණ යටපත් කර ගැනීමේ හැකියාව
D. තිලකුණු පිළිබඳ මනා අවබෝධයෙන් චාම් අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමේ හැකියාව
E. නිර්වාණය සාක් සාත් කර ගැනීමට හැකියාව ලැබේ.

1. ABCD 2. ABDE 3. ACDE 4. ABCE

(23) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගේ චරිතයෙන් අපට ගත හැකි වැදගත්ම ආදර්ශයක් වන්නේ,

1. ස්ථිර අධිෂ්ඨානයෙන් කටයුතු කිරීම 2. වැඩිහිටියන්ට සැළකීම
3. පිං පොතක් පවත්වා ගෙන යාම 4. ධර්ම දානය සඳහා පොත් රචනා කිරීම

(24) ජගත් නිතර පන්සලට යයි, දහම් ගුරුවරු ඇසුරු කරයි, ධර්මය අසයි, ධර්මයට අනුව ජීවත් වෙයි. ඔහු තුළ ඇති ගුණාංගය වන්නේ,

1. දැහැමි බවයි. 2. ශ්‍රද්ධාවන්ත බවයි. 3. ප්‍රඥාවන්ත බවයි. 4. පිංවත් බවයි.

(25) බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පිළිබඳව අසත්‍ය ප්‍රකාශයක් වන්නේ, දැහැමි පාලකයා,

1. දසරාජ ධර්මය අනුගමනය කළ යුතු ය. 2. සප්ත අපරිහානි ධර්ම අනුගමනය කළ යුතු ය.
3. සතර අගති අනුගමනය කළ යුතු ය. 4. සතර සංග්‍රහ වස්තු අනුව කටයුතු කළ යුතු ය.

(26) ''යමක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේ ද?, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය නැති වේද, එබඳු ක්‍රියාවල නිරත විය යුතුය.'' යන අදහස දැක්වෙන ගාථාවේ මුල් දෙපදය වන්නේ,

1. නතං කම්මං කතං සාධු 2. තංච කම්මං කතං සාධු
3. අත්තනාව කතං පාපං 4. සුකරානි අසාධුනී

(27) සමථ භාවනාව සඳහා යොදාගත හැකි කර්මස්ථාන හෙවත් කමටහන් ගණන,

1. 30 කි. 2. 40 කි. 3. 120 කි. 4. 60 කි.

(28) මම හෙවත් ආත්මය පිළිබඳ හැඟීම මුල්කොටගෙන ඇතිවන ආශාව හැඳින්වෙන්නේ,

1. කාම තණ්හා නම්නි 2. භව තණ්හා නම්නි 3. විභව තණ්හා නම්නි. 4. ත්‍රිවිධ තණ්හා නම්නි.

(29) බුදුරජාණන් වහන්සේ අටවන වස් කාලය ගත කළේ,

1. මකුල පර්වතයේ 2. පාරිලෙය්‍ය වනයේ 3. චාලිය පර්වතයේ 4. භෝෂකලා පර්වතයේ

(30) බුදුරජාණන් වහන්සේ සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කර ඇත්තේ,

1. ජීවක අඹ උයනේ දී 2. ඉසිපතන මිගදායේ දී
3. ඉච්ඡානංගල වනයේ දී 4. කලන්දක නිවාප නම් ස්ථානයේ දී

(31) අරහං ගුණය තේමා කරගෙන පූජාවලිය රචනා කළේ,

1. වීදාගම මෛත්‍රී හිමි 2. මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමි
3. රණස්ගල්ලේ හිමි 4. ධර්මසේන හිමි

(32) ශ්‍රී ලංකාවේ පැරණිම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති වශයෙන් සැලකෙන්නේ,

1. සිහලට්ඨ කථා හෙවත් හෙළ අටුවා ය. 2. සීගිරි ගී ය
3. සිඛවළඳ හා සිඛවළඳ විනිස ය. 4. ධර්ත ප්‍රදීපිකාව ය.

(33) ලෝකයේ වස්තු පුද්ගල සිද්ධි යන සියල්ලක්ම හේතු ප්‍රත්‍ය සම්බන්ධතාවකට අනුව ක්‍රියාත්මක වන බව පෙන්වා දෙන්නේ,

1. කර්ම විපාක සම්බන්ධතාවයෙනි.
2. පටිච්ච සමුප්පාදයෙනි
3. චතුරාර්ය සත්‍යයෙනි
4. පුනර්භව සංකල්පයෙනි

(34) ප්‍රථම, දෙවන හා තෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය දැක්වූ රජවරුන් පිළිවෙළින්,

1. ධර්මාශෝක රජු, කාලාශෝක රජු, අජාසත්ත රජු
2. අජාසත් රජු, ධර්මාශෝක රජු, කාලාශෝක රජු
3. අජාසත් රජු, කාලාශෝක රජු, ධර්මාශෝක රජු
4. කාලාශෝක රජු, අජාසත් රජු, ධර්මාශෝක රජු

(35) අවිධිමත් ලෙස, එමෙන් ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. එහිදී නැගිට ගැනීමටවත් බැරි තරමට කෑම ගෙන එහිම පෙරළී සිටින තැනැත්තා හඳුන්වා ඇත්තේ,

1. කාකාමාසක නම්නි
2. අලංසාටක නම්නි
3. භුත්තවම්තක නම්නි.
4. කත්ථාවට්ටක නම්නි

(36) සුවිනීතා දුගී පවුලක උපත ලැබුවද උසස් රූප සෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට හැකි විය. එසේ වූයේ,

1. ජනක කර්මය නිසා ය.
2. ප්‍රයෝග සම්පත්තිය නිසා ය.
3. උපධි සම්පත්තිය නිසා ය.
4. කාල සම්පත්තිය නිසා ය.

(37) මුනිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, සතර බණවර සන්නය යන ග්‍රන්ථ රචනා කළේ,

1. රේරුකානේ චන්දවිමල හිමි
2. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
3. වැලිවිට සරණංකර හිමි
4. වීදාගම මෛත්‍රී හිමි

(38) ''සමග්ගා හෝථ මා විවදථ'' යන්නෙහි අදහස වන්නේ,

1. සමගියෙන් විවාද කළ යුතුයි
2. සමගි වන්න, විවාද නොකරන්න
3. සමගිය විවාද නොකිරීමට හේතු වේ.
4. සමගියෙන් කරන විවාද යහපත් බවය.

(39) දැනට හමුවී ඇති සඳකඩ පහණ කිහිපය අතරින් කලාත්මක බවින් මුල් තැන ගත් සඳකඩ පහණ ඇත්තේ,

1. අනුරාධපුරයේ බිසෝ මාළිගය අසල
2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම
3. අනුරාධපුරයේ රත්න ප්‍රාසාදය අසල
4. පොළොන්නරුවේ ගල් විහාරයේ

(40) පරපණ නැසීම, සොරකම, වැරදි කාම සේවනය යන අකුසල් තුනෙන් වැළකීම ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ දක්වා ඇත්තේ,

1. සම්මා ආජීව ලෙසයි
2. සම්මා වායාම ලෙසයි
3. සම්මා කම්මන්ත ලෙසයි
4. සම්මා සංකප්ප ලෙසයි

39159

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :- .................................................................................. කාලය : පැය 02 යි.

- ❖ පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ❖ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක්ද තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමි ය.

(1) (i) බෞද්ධ භාවනාවේ ප්‍රභේද දෙක නම් කරන්න.
(ii) සිගාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් හා ගුරුවරුන් දක්වා ඇති දිශා පිළිවෙලින් නම් කරන්න.
(iii) ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය'' මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද?
(iv) සසර උපදින සත්වයාට පෙර කරන ලද කර්මවලට අනුව විපාක විඳීමට සිදුවන බව දැක්වෙන සූත්‍රය කුමක් ද?
(v) සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
(vi) දෙවන සංගායනාවේ ප්‍රතිඵල දෙකක් ලියන්න.
(vii) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා'' යන්නෙහි අදහස ලියන්න.
(viii) ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක නම් කරන්න.
(ix) දස අකුසල් අතර වචනයෙන් සිදුවන අකුසල් හතර ලියන්න.
(x) ''ජිගච්ඡා පරමා රෝගා' යන්නෙහි අදහස ලියන්න. (ලකුණු 2 × 10 = 20)

(2) (i) පාරමිතාවක් යනු කුමක්ද? (ලකුණු 2)
(ii) සෑම පාරමිතාවක්ම කොටස් තුනකට බෙදේ. ඒවා නම් කරන්න (ලකුණු 3)
(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට පාරමිතා ඉවහල්වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 5)

(3) (i) අත්තනාව කතං පාපං........... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)
(ii) එහි තේරුම ලියන්න. (ලකුණු 3)
(iii) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදය ඉවහල් කරගත හැකි අයුරු පැහැදිලි කරන්න (ලකුණු 5)

(4) (i) ස්තූපය සඳහා භාවිතා කරන නම්වලින් දෙකක් ලියන්න. (ලකුණු 2)
(ii) ගර්භයේ හැඩය අනුව ස්තූපය සයාකාරය ඉන් ආකාර තුනක් නම් කරන්න. (ලකුණු 3)
(iii) ලොවක් මවිතයට පත් කරන විවිධ කලා නිර්මාණවලින් පොහොසත් පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකමකි. ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 5)

(5) (i) පුස්තකාරූඪ සංගීතිය ලෙස හැඳින්වෙන්නේ කිනම් ධර්ම සංගායනාවද? (ලකුණු 2)
(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, අනුග්‍රහ දැක්වූ අය සහ සහභාගි වූ භික්ෂූන් වහන්සේලා ප්‍රමාණය අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 3)
(iii) පොදුවේ ගත් කළ සෑම ධර්ම සංගායනාවක් ම ශාසන උන්නතිය පිණිස හේතු විය. පැහැදිලි කරන්න. (ලකුණු 5)

(6) (i) කර්මය යනු කුමක්ද? (ලකුණු 2)
(ii) විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද 4කි. ඉන් තුනක් නම් කරන්න. (ලකුණු 3)
(iii) අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කරගත හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 5)

(7) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.
(i) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා
(ii) පටිච්ච සමුප්පාදය
(iii) බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණය
(iv) පරිසරය සුරකිමු (ලකුණු 10)